**ගොවීන්ගේ භාරකාර අරමුදල - 2015**

**---------------------------------------------**

ගොවීන්ගේ භාරකාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1994 මාර්තු 09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරමුදලේ භාරකරුවන් අතර එළඹි භාරකාර ඔප්පුවේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2002 වර්ෂයේ දී මෙම අරමුදලට චක්‍රීය අරමුදල සහ කෘෂිකාර්මික භාර අරමුදල ඒකාබද්ධ කිරීමේ දී එම අරමුදල්වල පැවති රු.81,147,096 ක් වූ පහත දැක්වෙන වත්කම් හා වගකීම් පවරා තිබුණි. එසේ වුවද, එම ශේෂ සනාථ කර ගැනීමට ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | **ජංගම වත්කම්** | | |
| (අ) | ඉතිරිකිරීමේ ගිණුම | 7,241,655 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ආ) | නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්- (කෘෂිකාර්මික භාරකාර අරමුදල) | 1,679, 901 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඇ) | ගොවි සමාගම් | 8,200,000 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (ඈ) | ණයගැති පාලන ගිණුම (කෘෂිකාර්මික භාරකාර අරමුදල) | 7,923,175 | ණය ගැති ශේෂ ලැයිස්තුව |
| (ඉ) | ණයගැති පාලන ගිණුම - චක්‍රීය අරමුදල | 44,200,176 | විස්තරාත්මක උපලේඛන |
| | **ජංගම නොවන වත්කම්** | | |
| (අ) | ලැබිය යුතු දිගුකාලීන ණය - ගොවිජන සේවා කමිටු ගිණුම | 9,112,579 | ණයගැති ශේෂ ලැයිස්තුව |
| (ආ) | කුළුබඩු ආශ්‍රිත ද්‍රව්‍ය මණ්ඩලය | 1,500,000 | ණයගැති ශේෂ ලැයිස්තුව |
| | **ජංගම නොවන බැරකම්** | | |
| | ගොවීන්ගේ තැන්පතු | 697,644 | තැන්පත් ලේඛනය |

**ශුද්ධ වත්කම්/ස්කන්ධය**

| | | |
|---|---|---|
| කොටස් | 591,965 | කොටස්කරුවන්ගේ කොටස් මුදල් දැක්වෙන නාම ලේඛනය |
| | 81,147,095 | |

## 2.3 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්තිකාරම් යටතේ වර්ෂ 10කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවති එකතුව රු.8,054,388 ක් වූ ශේෂ 04 ක් අයකර ගැනීම සඳහා 2014 ඔක්තෝබර් මාසයේදී තෙවන පාර්ශවයක් පත් කළ ද මෙතෙක් මෙම ණය මුදල් අයකර ගෙන නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයෙන් අයවිය යුතු රු.98,023,448 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණ අතර එය මුළු ණය මුදලින් සියයට 83 ක් විය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.34,053,478 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,814,015 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.45,867,493 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොලී ආදායම රු.26,116,366 කින් අඩුවී තිබුණද සංවර්ධන වියදම් රු.71,120,185 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

2011 සිට සමාලෝචිත වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂය හැර අනෙකුත් වර්ෂයන්හිදී මූල්‍ය අතිරික්තයක් පැවතුණි. සේවක පාරිශ්‍රමික, ආදායම් බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමේදී අරමුදලේ දායකත්වය 2014 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂයන්හිදී ධනාත්මක අගයක් ගෙන තිබුණද පෙර වර්ෂයන් හා සැසඳීමේදී 2013,2014 වර්ෂයන්හි දායකත්වය පිළිවෙලින් සියයට 94 කින් හා 175 කින් පිරිහී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී එය නැවතත් සියයට 457 කින් වර්ධනය වී තිබුණ අතර අරමුදල විසින් දරා තිබූ සංවර්ධන වියදම් දායකත්වයේ උච්චාවචනයන් කෙරෙහි සෘජු ලෙස බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

මෙරට ගොවි ජනතාවගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනය වැඩිදියුණු කිරීම, සුළු ගොවීන් සඳහා කෙටි කාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, සුළු ගොවීන් සඳහා කෘෂි යෙදවුම් සම්පාදනය, මුදල් දුෂ්කරතාවයන් මග හරවා ගැනීම සඳහා සුළු ගොවීන්ට වෙළඳ පොළ ණය පහසුකම් සැලසීම, සුළු ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභසාධනයට අදාළව දැනුවත් කිරීම, ප්‍රදර්ශන හා ආදර්ශන පැවැත්වීම හා වෙනත් විවිධ කාර්යයන් වෙනුවෙන් නියාමක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම, භෝග හා සත්ව නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සුළු ගොවීන්ට සහාය වීම සහ කෘෂිකාර්මික සංවර්ධනයට පහසුකම් සැපයීම උදෙසා විශේෂිත කෘෂිකාර්මික වැඩ ක්‍රියාත්මක කිරීම

යන අරමුණු ඉටු කිරීම පිණිස ගොවි භාරකාර අරමුදල ස්ථාපිත කර තිබුණි. ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) ගොවීන්ගේ කෘෂිකාර්මික සංවර්ධනය හා සුභ සාධනය වැඩි දියුණු කිරීම.**

අරමුදලේ 2015 වර්ෂයේ අයවැය ලේඛණයට අනුව සංවර්ධන කටයුතු සඳහා රු.170,200,000 ක් වෙන් කර තිබුණ ද ,සමාලෝචිත වර්ෂය තුළ දී එම ප්‍රතිපාදන වලින් සියයට 72 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කර නොමැති බව ද නිරීක්ෂණය විය.

**(ආ) සුළු ගොවීන් සඳහා කෙටි කාලීන කෘෂිකාර්මික ණය පහසුකම් සැලසීම.**

(i) කෙටිකාලීන ණය යටතේ වෙන්කළ ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කළ ව්‍යාපෘති 12 න් ව්‍යාපෘති 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එනම් වෙන්කළ ප්‍රතිපාදන මුදල වූ රු. 40,610,495 න් වැය කර තිබුණේ සියයට 45 ක් පමණි.

(ii) කෙටි කාලීන ණය වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ දී අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දී තිබූ රු. 21,361,038 ක මුදලින් විගණිත දිනය වූ 2016 ජුනි 30 දින වන විට රු. 7,908,500 ක් පමණක් අය වී තිබූ අතර එය ලබා දුන් ණය මුදලින් සියයට 37කි.

(iii) සමස්ථයක් ලෙස ගත් කළ සමාලෝචිත වර්ෂයේ දී ලබා දීමට ඇස්තමේන්තු කළ මුළු ණය මුදල වූ රු. 285,000,000 න් වර්ෂය තුළ ණය ලෙස ලබා දී තිබුණේ සියයට 32 ක් පමණක් බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංවර්ධන කාර්යයන් සඳහා 2013 සහ 2014 වර්ෂයන්හි දී ලබා දී තිබුණු අත්තිකාරම් වලින් පිළිවෙලින් රු.1,749,740 ක් හා රු.958,687 ක් පියා නොවූ ශේෂ ලෙස තව දුරටත් පැවතුණි. පෙර වර්ෂවල ලබාදී තිබූ අත්තිකාරම් මුදල් පියවීම ප්‍රමාදවීම මෙම වර්ෂයේ සංවර්ධන වියදම සියයට 79 ක් අඩුවීමට බලපා තිබුණි.

(ආ) දිගුකාලීන ණය යටතේ වයඹ පළාත තුළ වී වගාවේ අස්වැන්න වැඩි කිරීමේ අරමුණින් පැල සිටුවීමේ යන්ත්‍ර මිලදී ගැනීමට ගොවීන් වෙත ණය මුදල් සැපයීම සඳහා රු. 40,000,000 ක් වෙන් කර තිබුණද, ගොවීන් තෝරා ගැනීම සහ ණය ලබා දීමේ ක්‍රියාවලියට අදාල ගැටළු නිරාකරණය කිරීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 51 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**-----------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව 2015 වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**-----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැති පාලනය | ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රමාදය සහ හඳුනා නොගත් ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රමාදය. |
| (ආ) | අරමුදල් උපයෝජනය | ඇස්තමේන්තුගත පරිදි ණය මුදල් ගෙවීම හා සංවර්ධන වියදම් දැරීම සඳහා අරමුදල් උපයෝජනය නොකිරීම. |